# 2026-02-23 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන හා සේවකයන් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස නියාමනය කිරීම

රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතනවල ආරක්ෂක කටයුතුවල යෙදෙන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන 1,050ක් යටතේ මේ වන විට සේවකයින් 150,000ක් පමණ සේවයේ යෙදී සිටින බව වාර්තා වී ඇත. 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යටතේ පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන හා එහි සේවකයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නෛතික ප්‍රතිපාදන සැලසී තිබේ. වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් එකී ආයතන හා සේවකයින් ඵලදායී ලෙස නියාමනය කිරීමට මෙන්ම කාර්යක්ෂම සේවයක් ලබා දීමට එම නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කරනු ලැබ ඇත. එබැවින්, සපයනු ලබන සේවාවේ ස්වභාවය අනුව සේවා වර්ගීකරණය, එම වර්ගීකරණය මත පදනම්ව ආරක්ෂක සේවාවන්හි නිරත සේවකයින් පුහුණු කිරීම, ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් යටතට ගැනෙන පුහුණු අවස්ථා සලසා දීම වැනි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙන්ම, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ලියාපදිංචිය හා බලපත්‍ර අවලංගු කිරීම සහ එම ආයතන වෙත ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම වැනි කාර්යයන් නියාමනය කිරීමට හැකි වන පරිදි නව නෛතික ප්‍රතිපාදන හඳුන්වා දීමට යෝජනා කර තිබේ. ඒ අනුව, එකී නෛතික ප්‍රතිපාදන හඳුන්වා දීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 02. ජාතික තීරුබදු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ, ආයෝජන සහ රාජ්‍ය මූල්‍ය අරමුණු සඳහා රුකුලක් සැපයීම පිණිස විනිවිදභාවයෙන් යුතු පුරෝකථනය කළ හැකි සහ සංගත (Coherent) තීරුබදු රාමුවක් ස්ථාපනය කිරීම පිණිස ජාතික තීරුබදු ප්‍රතිපත්තිය හඳුන්වා දෙනු ලැබ ඇත. අදාළ බදු සම්බන්ධිත අණපනත් ගමන අනුකූලතාවය සහතික කිරීම සහ එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත පැන නැගී ඇති ගැටලු විසඳීමේ අරමුණින් එම ප්‍රතිපත්තිය නැවත සමාලෝචනය කර යෝග්‍ය සංශෝධන හඳුන්වා දීම සඳහා 2025-11-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව විසින් මෑතකාලීන ආර්ථික, රාජ්‍ය මූල්‍ය සහ



163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

වෙළෙඳ කටයුතු ආශ්‍රිත දත්ත මෙන්ම අදාළ වන නීති අණපනත් සමඟ පූර්ණ වශයෙන් අනුකූල නොවන තීරුබදු ප්‍රතිපත්තියේ විධිවිධාන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කරනු ලැබ ඇත. එසේම, ජාතික තීරුබදු ප්‍රතිපත්තියේ ව්‍යාකූලතාවන් ඉවත් කිරීම සහ ප්‍රතිපත්තිමය විධිවිධාන හා ව්‍යාවස්ථාපිත අවශ්‍යතා සමඟ අනුකූලතාව සහතික කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙනු ලැබ ඇති නිරීක්ෂණ ද එකී සමාලෝචනයේදී සැලකිල්ලට ගෙන තිබේ. ඒ අනුව, ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව යාවත්කාලීන කළ ජාතික තීරුබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

03. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කාර්යාංශය අතර සහයෝගිතා ගිවිසුමක් අත්සන් තැබීම

සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන රටවලින් යුරෝපයට ආනයනයන් සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම සහ තිරසර බව වැඩි කිරීමේ අරමුණින් ස්ථාපිත කරනු ලැබ ඇති ආයතනයක් වන ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර සහයෝගිතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී තිබේ. එම ගිවිසුමට අත්සන් තැබීම මගින් ස්වභාවික අමුද්‍රව්‍ය සහ තොරතුරු තාක්ෂණ බාහිරකරණ අංශවල ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාරවලට, ජර්මානු සහ යුරෝපීය වෙළෙඳපොළ වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සහාය වනු ඇත. ඒ අනුව, යෝජිත සහයෝගිතා ගිවිසුම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කාර්යාංශය අතර අත්සන් තැබීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. ජාතික නිවාස මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සැලකිය යුතු සංඛ්‍යාවකට නිවාස නොමැති බව 2024 ජන හා නිවාස සංගණනය මගින් වාර්තා කරනු ලැබ තිබේ. ඒ අතරින් අඩු ආදායම්ලාභී ජනතාව, වතු ප්‍රජාව, ආබාධ සහිත පිරිස්, ධීවර ජනතාව, නිවාස අහිමි නාගරික ජනතාව සහ විවිධ හේතු මත අවතැන් වූ පිරිස් යන සුවිශේෂී කාණ්ඩ සඳහා නිවාස නොමැතිකම ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. එබැවින්, සහභාගිත්ව සැලසුම්කරණය, ආර්ථික ඵලදායිතාව, පාරිසරික සුරක්ෂිතතාව, සාමාජීය අන්තර්කරණය සහ සංස්කෘතික යෝග්‍යතාව යනාදී මූලධර්ම පදනම් කර

ගනිමින් වර්තමාන ජාතික නිවාස ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කළ යුතුව ඇත. මේ වන විට අමාත්‍යාංශ හා අනුබද්ධ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ ප්‍රජා සංවිධාන විසින් විවිධ ක්‍රමවේද හා ප්‍රමිතීන්ට අනුව නිවාස වැඩසටහන් ක්‍රියාවට නංවමින් සිටින බැවින්, නිවාස අංශයේ වගකීම බෙදී විසිරී පවතී. 2026 වර්ෂය තුළ නිවාස ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 100කට ආසන්න මුදලක් වෙන් වී තිබේ. අපේක්ෂිත අරමුණු ප්‍රශස්ථ මට්ටමින් ළඟා කර ගැනීම සඳහා, දැනට ක්‍රියාත්මක හා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ ඇති නිවාස වැඩසටහන් ජාතික වශයෙන් ඒකාබද්ධ වැඩපිළිවෙලක් යටතේ ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ජාතික නිවාස වැඩසටහන සඳහා මාර්ගෝපදේශ සැපයීම, තාක්ෂණික උපදෙස් ලබා දීම, අධීක්ෂණ ගැටලු විසඳීමට මැදිහත්වීම හා පසුවිපරම් කිරීම පිණිස ජාතික නිවාස මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. මෝටර් ග්‍රේඩර් 75ක් මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය

2025-10-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය මත රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා යොදා ගැනීම පිණිස මෝටර් ග්‍රේඩර් 75ක් මිල දී ගැනීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ අනුව ඉදිරිපත් කර තිබූ ලංසු 05ක් ඇගයීමෙන් අනතුරුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම් ව, එකී ප්‍රසම්පාදනය United Tractors & Equipment (Private) Limited වෙත රුපියල් මිලියන 1,424.25ක (එකතු කළ අගය මත බදු රහිත) මුදලකට පිරිනැමීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. කෙරවලපිටිය කර්මාන්ත කලාපය තුළ පිහිටි කෙරවලපිටිය අධිවේගී පිවිසුමේ සිට ඇලකන්ද මාර්ගය දක්වා වන මාර්ග කොටස සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කෙරවලපිටිය ප්‍රදේශයේ සංවර්ධනය කරන ලද අක්කර 400ක පමණ භූමි ප්‍රමාණයක ලිට්‍රෝ ගෑස් සමාගම, ඛනිජතෙල් පර්යන්ත සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති ගණනාවක් ස්ථාපිත කරනු ලැබ ඇත. අධිවේගී මාර්ගයට ප්‍රවේශයක් ලෙස භාවිත කරනු ලබන එම කර්මාන්ත කලාපය මැදින් පිහිටා ඇති, කෙරවලපිටිය අධිවේගී පිවිසුමේ සිට ඇලකන්ද මාර්ගය දක්වා වන කිලෝමීටර 2.2ක් පමණ වන මාර්ග කොටස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක්

2021 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කර ඇති නමුත්, මෙරට පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් එහි ඉදිකිරීම කටයුතු අවසන් කර නොමැත. මේ වන විට දැඩි ලෙස අබලන්ව පවතින එම මාර්ග කොටස කඩිනමින් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගෙන, එකී මාර්ග කොටස ගමනාගමනයට සුදුසු වන පරිදි කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමටත්, ඉන් අනතුරුව දීර්ඝකාලීන විසඳුමක් ලෙස එම මාර්ගය පුළුල් කිරීම සඳහා විධිමත් අධ්‍යයනයක් සිදු කර, මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන භාවිත කරමින් එම මාර්ග කොටස සංවර්ධනය කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

07. ප්‍රංශයේ පැරිස් චාල්ස් ඩී ගෝල් ගුවන්තොටුපොළෙහිදී ශ්‍රීලංකන් ගුවන් සේවය සඳහා බිම් මෙහෙවර සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව

ප්‍රංශයේ පැරිස් චාල්ස් ඩී ගෝල් ගුවන්තොටුපොළෙහිදී ශ්‍රීලංකන් ගුවන් සේවය සඳහා මගීන් හසුරුවාලීමේ හා බිම් මෙහෙවර සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව සහ භාණ්ඩ ගබඩා හසුරුවාලීමේ සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සීමිත තරගකාරී ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 04ක් ලැබී තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, පහත පරිදි එකී කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* මගීන් හසුරුවාලීමේ හා බිම් මෙහෙවර සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන Groupe Europe Handling වෙත යුරෝ මිලියන 7.73ක මුදලකට 2026-04-01 දින සිට වසර 03ක කාලසීමාවක් සඳහා පිරිනැමීම.

* භාණ්ඩ ගබඩා සේවා හසුරුවාලීමේ සේවා කොන්ත්‍රාත්තුව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන France Handling Cargo වෙත යුරෝ මිලියන 1.90ක මුදලකට 2026-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 03ක කාලසීමාවක් සඳහා පිරිනැමීම.

08. අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය - II අදියරෙහි ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම

ශ්‍රී ලංකා රජයේ සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය - අදියර II යටතේ යාන් ඔය ජලාශයෙන් ජලය ලබා ගෙන පදවිය, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, හොරොව්පතාන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචිකරුවන්ට සහ රඹෑව හා මැදවච්චිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කොටසක පදිංචිකරුවන්ට ආරක්ෂිත පානීය ජලය සැපයීමට සැලසුම් කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම පිණිස ජපාන ODA ණය මාර්ගෝපදේශයට අනුකූලව ගුණාත්මකභාවය සහ පිරිවැය පදනම් කර ගත් තේරීම් ක්‍රමය භාවිත කරමින්, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් කෙටි ලැයිස්තුගත කරන ලද ජපානයේ උපදේශන සමාගම් 06ක් වෙතින් යෝජනා කැඳවා ඇත. ආයතන 02ක් විසින් යෝජනා ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී යෝජනාවන්හි තාක්ෂණික සහ මූල්‍ය යෝජනා ඇගයීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව එකී උපදේශන කොන්ත්‍රාත්තුව ඉන්දියාවේ M/s. Nippon Koei India Pvt Ltd සහ ශ්‍රී ලංකාවේ Green Tech Consultants Pvt Ltd. සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් වන M/s. Nippon Koei Pvt Ltd වෙත ජපන් යෙන් මිලියන 82.39ක සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 332.01ක මුදලකට (බදු රහිත) පිරිනැමීම පිණිස නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. 2026 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රජය විසින් දේශීය වාණිජ බැංකු ඉලක්ක කරගනිමින්, විදේශ ව්‍යවහාර මුදල්වලින් නාමනය කරන ලද දේශීය ණය උපකරණ නිකුත් කිරීම පිණිස 2025-10-13 වන දින පවත්වනු ලැබූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එහි පළමු නිකුත් කිරීම 2025-12-10 වන දින සිදු කරනු ලැබ තිබේ. එහෙත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නීතිරීති සහ උපදෙස්වලින් පැන නැගුණු සීමා හේතුවෙන්, එකී පළමු නිකුත් කිරීම සංස්ථාගත කරන ලද වාණිජ බැංකු සඳහා පමණක් සීමා වී ඇත. එබැවින්, ඉල්ලුම වැඩි කිරීම, තරගකාරී මිලකරණය සහතික කිරීම සහ රජය සතු විදේශ ව්‍යවහාර අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම වෙනුවෙන් දේශීය ඩොලර් බැඳුම්කරවල ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා අපනයනකරුවන්ට දේශීය

ඩොලර් බැඳුම්කරවල ආයෝජනය කිරීමට හැකිවන පරිදි 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාරව නිකුත් කරන ලද '2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව, 2026-01-30 දිනැති අංක 2473/30 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් '2026 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. එකී රීති අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම**

2026 අයවැය යෝජනාවක් අනුව, 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කර තිබේ. එම පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********